**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| **පළමු වාර පරීක්ෂණය 2018** | **7 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 7** |
| **First Term Test 2018** | **Grade 7** |

| | |
|---|---|
| ***පෙරදිග සංගීතය - I*** | ***පැය 2 යි*** |
| ***Oriental Music - I*** | ***2 Hour*** |

නම / විභාග අංකය ......................................................................................................................................

<u>**සැලකිය යුතුයි.**</u>

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් හිමිවේ.**
- **වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පෙරදිග සංගීතයේ ප්‍රධාන ස්වර ගණන,
    i. 4 කි ii. 6 කි. iii. 3 කි Iv. 7 කි
02. සප්තකයක යෙදෙන අචල ස්වර වන්නේ,
    i. ස, ම ii. ස, ප iii. ග, ප Iv. ම, ග
03. මන්ද්‍ර පංචමයේ සිට මධ්‍ය සඩ්ජය දක්වා ඇති විකෘති ස්වර ගණන,
    i. 2 කි ii. 3 කි. iii. 4 කි Iv. 5 කි

04. ශුද්ධ ස්වර ස්ථාපන ගීයක් නොවන්නේ,
    I. කඳුපෙළ අතරේ ii. ගී ගයන මේ කුරුලු
    iii. සවන පිනන ගීත මිහිර iv. ආදරේ ඇයි පොඩි හඳ මාමේ

- **අංක 05 සිට 08 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරුවලින් තෝරා ලියන්න.**
  **(ග ම ප ධ , ස රි ග රි ස, සින්තසයිසරය, මාත්‍රා 4න් 4 ට)**

05. බැතිනා සිරිපා කරුණා කරනා යන ස්වරස්ථාපන ගීතය ගැයෙනුයේ .................................................. ය.

06. සරිගම, රිගමප යන ශුද්ධ ස්වර අභ්‍යාසයේ මීළඟට යෙදෙන ස්වර ඛණ්ඩය ........................................... ය.

07. නූතන තාක්ෂණයත් සමඟ භාවිතයට ගන්නා ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක් වන්නේ ...............................ය.

08. CDEDC යන අපරදිග ස්වර ඛණ්ඩය පෙරදිග ස්වර නාම අනුව ලියූ විට ............................................... වේ.

- **අංක 9 සිට 13 තෙක් ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර යා කරන්න.**

| | |
|---|---|
| 09. විභාගයක් සෑදෙනුයේ | a) සංගීතයේ කාලය මනින මිම්මයි |
| 10. මාත්‍රාව යනු | b) තාලයේ වේගයයි |
| 11. තාලයක් යනු | c) මාත්‍රා කිහිපයක එකතුවකි |
| 12. ලය යනු | d) සුළු, මැදුම්, මහ |
| 13. තනි තිතේ ප්‍රභේද | e) කාලය මනින කුඩාම ඒකකයයි |

- **අංක 14 සිට 16 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අදින්න.**

14. මාත්‍රා දෙකෙන් දෙකට ගැයෙන ගී පාදය වන්නේ,
    I. නිල් අහස් තලේ ii. මිහිකත නලවාලා
    iii. කිරි සුදු හාවා iv. සුවඳ පද්ම

15. ත්‍රී තාලයට අයත් තාල සංඥා පිළිවෙලින්
    i. X 0 2 3 ය ii. X 2 0 3 ය iii. X 0 2 0 ය iv. X 2 3 0 ය

16. මැදුම් තනි තිතෙහි මාත්‍රා බෙදෙනුයේ
    i. 1 2 3/ 1 2 3 වශයෙනි ii. 12 / 1 2 3 වශයෙනි
    iii. 1234/ 1234 වශයෙනි iv. 1 2 3/ 1 2 3 4 වශයෙනි

- **පහත සඳහන් පුද්ගල නාම ඇසුරින් අංක 17 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A සී.දොන් බස්තියන් මහතා B ආනන්ද සමරකෝන් මහතා

C පණ්ඩිත් අමරදේවයන් D සුනිල් ශාන්ත ශූරීන්

17. ලංකා ලංකා , දකුණ නැගෙනහිර යන දේශාභිමානී ගීත වල රචකයා ඇක්වෙන ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,

    i . A ය. ii B ය. iii C ය. Iv D ය.

18 ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ,

    i A ය. ii B ය. iii C ය. Iv D ය.

19. රත්න දීප ජන්ම භූමි, සසර වසන තුරු, ආදී ගීත සම්බන්ධ සංගීතඥයා දැක්වෙන අක්ෂරය,

    i. A ය. ii B ය. iii C ය. Iv D ය.

20. සිංහල නූර්ති කලාවේ පුරෝගාමියා ලෙස පිළිගනු ලබන්නේ,

    i . A ය. ii B ය. iii C ය. Iv D ය.

## <u>II පත්‍රය</u>

**01. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න. (පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ. )**

i. ස්වර සප්තකය පිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 02)
ii. ත්‍රිවිධ ස්වර සප්තක නම් කරන්න. (ලකුණු 03)
iii. ස්වර පුවරුවක් ඇඳ, ත්‍රිවිධ සප්තකයේ ස්වර පිළිවෙලින් ලකුණු කරන්න. (ලකුණු 05)
iv.

**02. පහත වගුව සම්පූර්ණ කරන්න.**

**i**

| | |
|---|---|
| ආරෝහන පිළිවෙළට ස්වර 12 ලියන්න | a) |
| ප්‍රකෘති ස්වර ගණන | b) |
| විකෘති ස්වර ගණන | c) |
| කෝමල ස්වර ගණන | d) |
| තීව්‍ර ස්වර ගණන | e) |

(ලකුණු 1 x 5)

ii ඔබ උගත් ශුද්ධ ස්වර් ස්ථාපන ගීයක් ලියා දක්වන්න. (ලකුණු 05)

**03. පහත සඳහන් ගීත මාත්‍රා බෙදීම අනුව වගුවෙහි ලියා දක්වන්න.**

i

- ❖ දිය ගොඩ සැම තැන
- ❖ සසර වසන තුරු
- ❖ නිල් අහස් තලේ
- ❖ උඩරට මැණිකෙට
- ❖ සුවඳ පද්ම ඕලු ආදී
- ❖ පොත පත කියවා

| මාත්‍රා 2 බැගින් බෙදෙන ගී පද | මාත්‍රා 3 බැගින් බෙදෙන ගී පද |
|---|---|
| | |
| | |
| | |

(ලකුණු 1 x 6 = 6)

ii ලාවණී තාලය නියමිත තාල සංඥා යොදා ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04)

04. i ඔබ උගත් නූර්ති නාට්‍ය 3ක් නම් කරන්න. (ලකුණු 03)

ii ඔබ උගත් නූර්ති ගීයක් ලියා දක්වන්න. (ලකුණු 07)